පාර්ලිමේන්තුවේ පුස්තකාලය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 24 දරන
# දේශීය ආදායම් (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1980 ජූනි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ජූනි මස 26 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ: රු. 1.55 යි　　තැපැල් ගාස්තුව: ශත 75 යි

# 1980 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූනි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 35/79.

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1980 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 7 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **1979 අංක 28 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "සහ (ඉ) ඡේදයෙහි" යන වචන වෙනුවට "(ඉ) ඡේදයෙහි සහ (ඕ) ඡේදයෙහි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයෙහි (ii) අනුඡේදයෙහි එන, "මුදල් ප්‍රමාණයක් විය යුතු ය ; තවද" යන වචන වෙනුවට, "මුදල් ප්‍රමාණයක් විය යුතු ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයෙහි එන, "මුදල් ප්‍රමාණයක් විය යුතු ය." යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණයක් විය යුතු ය ; තව ද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඕ) යම් දේපළක් නිශ්චල දේපළක් වන අවස්ථාවක සහ 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර ඒ දේපළ අත්කර ගනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තාගෙන් ප්‍රාග්ධන ලාභ අත්වන තැනැත්තා විසින් 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ත්‍යාගයක හෝ උරුමයක ආකාරයෙන් ඒ දේපළ අත්කර ගනු ලැබූ අවස්ථාවක, දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ අත්කර ගනු ලැබූ අවස්ථාවේ දී, එහි වටිනාකම 1977 අප්‍රේල් මස 1 වන දිනට පසුව දෙවනුව සඳහන් තැනැත්තා විසින් ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම්වල වියදමෙන් වැඩි කරන ලද 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි වෙළෙඳ අගයට සමාන මුදලක් විය යුතු ය." ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "මේ පනතේ 23 වන වගන්තිය යටතේ" යන වචන වෙනුවට "මේ පනතේ 23 වන වගන්තිය යටතේ හෝ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි—

(අ) ඒ ඡේදයේ (xviii) අනුඡේදයේ "1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (xxv) අනුඡේදයෙහි "යම් ජාතික ලොතරැයියකින්" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් ජාතික ලොතරැයියකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ ඡේදයේ (xxvi) අනුඡේදයෙහි "සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය;"; සහ

(ඈ) ඒ ඡේදයේ (xxvi) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xxvii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනම ;

(xxviii) 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම් පනතින් පිහිටුවන ලද ටවර් හෝල් රඟහල පදනම ;

(xxix) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව ;

(xxx) වෛද්‍ය ආඥාපනතින් පිහිටුවන ලද ලංකා වෛද්‍ය සභාව ;

(xxxi) 1961 අංක 31 දරන ආයුර්වේද පනතින් පිහිටුවන ලද ආයුර්වේද වෛද්‍ය සභාව ; සහ

(xxxii) 1970 අංක 7 දරන හෝමියෝපති පනතින් පිහිටුවන ලද හෝමියෝපති සභාව ;";

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි—

(අ) ඒ ඡේදයේ (iii) අනුඡේදයෙහි "ඒ සංස්ථාවේ" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ සංස්ථාවේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (iii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iv) විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක යම් ගණුදෙනු කටයුතුවලින් රටට උපචිත වීමට ඉඩ ඇති විදේශීය විනිමය වාසි කෙරෙහි සැලකිල්ල ඇතිව, ඒ ඒකකයේ අක් වෙරළෙහි සියලු ගණුදෙනුවලින් සහ ඒ ඒකකයේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි පෙර වෙරළෙහි විදේශීය ව්‍යවහාර මුදල් ගණුදෙනුවලින් ඇති වන්නා වූ"; සහ

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ (i) අනුඡේදයෙහි "ඒ ව්‍යාපාරය හා සම්බන්ධ" යන වචන වෙනුවට "ඒ ආයතනයේ මූලික කාර්යය සැබවින් ම ක්‍රියාත්මක කරන අතරතුර කරගෙන යනු ලබන ව්‍යාපාරයක් හෝ ඒ ව්‍යාපාරය හා සම්බන්ධ" යන වචන ආදේශ කිරීමෙන්;".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් ඒ වගන්තිය නැවත අංක කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයෙහි—

(i) ඒ ඡේදයෙහි (iii) වන අනුඡේදයෙහි "කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ" යන වචන වෙනුවට "කොළඹ ක්‍රම සංවිධානය මගින් හෝ ආසියා පදනම මගින් හෝ"; යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ii) ඒ ඡේදයේ (vi) වන අනුඡේදයේ එන, "ගුවන් හමුදාවක සාමාජිකයකුගේ; සහ" යන වචන වෙනුවට, "ගුවන් හමුදාවක සාමාජිකයකුගේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ ඡේදයේ (vii) වන අනුඡේදයේ එන, "සිවිල් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකුගේ," යන වචන වෙනුවට, "සිවිල් තත්ත්වයකින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තකුගේ; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(iv) ඒ ඡේදයේ (vii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (viii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ආසියා පදනම විසින් ශ්‍රී ලංකාවෙහි සේව යෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද යම් තැනැත්තකුගේ ";

(ඇ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඔ) ඡේදයෙහි "ඒ පඩිනඩි; සහ" යන වචන වෙනුවට "ඒ පඩිනඩි;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදයෙහි "රුපියල් එක් දහස් දෙසීයක් නොඉක්මවන ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "රුපියල් එක් දහස් දෙසී යක් නොඉක්මවන ලාභ සහ ආදායම;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදයට ඉක් බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්—

" (ක) යම් සේවා නියුක්තයකු පදිංචි ස්ථානයේ සිට වැඩ කරන ස්ථානයට හෝ වැඩ කරන ස්ථානයේ සිට ඔහුගේ පදිංචි ස්ථානයට හෝ ගමන් කිරීම සඳහා සේවා යෝජකයකු විසින් ඒ සේවා නියුක්තයාට සපයන ලද මෝටර් කෝච් රථයකින් නොමිලේ ප්‍රවාහනය කිරීමේ වටිනාකම. "; සහ

(ඊ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්—

" (2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි හෝ (ඇ) ඡේදයෙහි හෝ (ඈ) ඡේදයෙහි හෝ (ඉ) ඡේදයෙහි සඳහන් කිසිවක් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව සමග ගිවිසුමකට එළඹී ව්‍යවසායක් නොවන යම් ව්‍යවසායක් සමග හෝ ව්‍යවසායක් විසින් 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව—

(අ) සේවා නියුක්ත ගිවිසුමකට ඇතුළත් වූ ද ; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබ, සේවයෙහි නියුක්ත කරනු ලැබුවා වූ ද

යම් පුද්ගලයකුට හෝ ඔහු සම්බන්ධයෙන් හෝ අදාළ නොවිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (ඊ) ඡේදයෙහි "කොටසක් වන යම් පොලියක්" යන වචන වෙනුවට "කොටසක් වන යම් පොලියක් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(උ) යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග විදේශීය ව්‍යවහාර මුදල්වලින් යම් තැනැත්තකුගේ බැරට ඇති මුදල් මත ඔහුට උපචිත වන පොලිය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි—

(i) "මේ පනතේ 16 වන, 17 වන, 18 වන, 19 වන, 20 වන හෝ 21 වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ පනතේ 15, 16, 16අ, 16ආ, 17, 18, 19, 20, 21, 22අ, 22ආ සහ 22ඇ වන වගන්ති යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) "ගෙවනු ලබන ලාභාංශයක්" යන වචන වෙනුවට "ගෙවනු ලබන යම් ලාභාංශයක් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) සමාගමක් විසින් ලබා ගන්නා ලද, (ආ) ඡේදයෙහි සඳහන් යම් ලාභාංශයකින්, ඒ සමාගමේ කොටස් හිමියන්ට 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව ගෙවනු ලබන යම් ලාභාංශයක්, ඒ දෙවනුව සඳහන් ලාභාංශය ගෙවනු ලැබුවේ ඒ සමාගම විසින් පළමු සඳහන් ලාභාංශය ලැබීමෙන් එක් වර්ෂයක් ඇතුළත නම් හෝ ඉන් පසු යම් තක්සේරු වර්ෂයක් තුළ නම්,".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ ඡේදයේ (xi) අනුඡේදයේ "පැවරීමෙන් හෝ නැති වී යාමෙන්" යන වචන වෙනුවට "පැවරීමෙන් හෝ නැති වී යාමෙන් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදයේ (xii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xiii) නිල ලැයිස්තුගත පොදු සමාගමක කොටස් වන්නා වූ යම් දේපළක් 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන්පසුව සංක්‍රාන්තිවීමෙන් ; සහ

(xiv) (අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව, සහ

(ආ) පුද්ගලයකු තුදෙක් ම හෝ වෙනත් අය සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ කරගෙන යනු ලබන ව්‍යාපාරයක් නිල ලැයිස්තුගත පොදු සමාගමකට පරිවර්තනය කරනු ලැබූ විට,

1977 මාර්තු මස 31 වන දිනට පෙර ඒ ව්‍යාපාරය සඳහා අත්කර ගන්නා ලද වත්කම්වල යම් කොට සක් 1977 මාර්තු මස 31 වන දින එම වත්කම්වල වෙළෙඳ අගය නොඉක්මවන මිලකට ඒ සමාගමට පවරනු ලැබුවේ නම් සහ එසේ පවරනු ලැබුවේ නම් පමණක්, ඒ ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කම්වල යම් කොටසක් ඒ සමාගමට පැවරීමෙන් ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඒ) ඡේදයේ " යම් රාජ්‍ය භාගයක් " යන වචන වෙනුවට " යම් රාජ්‍ය භාගයක් ; " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

" (ඔ) 16අ වගන්තියෙහි සඳහන් සමාගමක් විසින් ඒ සමාගමේ ලාභ සහ ආදායම නිදහස් කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද ඒ කාලය සඳහා, දළ ලාභවල ප්‍රතිශතයක් වශයෙන් ආගණනය කරනු ලැබ, නිර්වාසික තැනැත්තකුට ගෙවන ලද යම් කළමනාකරණ ගාස්තු, ඒ නිර්වාසික තැනැත්තන් වෙත කරනු ලබන ඒ ගෙවීම, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම් ;

(ඕ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ලංකා වෙළෙඳ මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් මැණික් වෙන්දේසියක දී මැණික් විකිණීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම ;

(ක) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව මැණික් අපනයනය කිරීමෙන් යම් තැනැත්තකුට ලැබෙන ලාභ සහ ආදායම ;

(ග) යම් තැරැව්කරුවකු විසින් ලංකා වෙළෙඳ මණ්ඩලයෙන් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම්, ඒ මණ්ඩලය විසින් පවත්වනු ලබන යම් මැණික් වෙන්දේසියක දී මැණික් විකිණීමෙන් ඒ තැරැව්කරු විසින් 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ලබා ගන්නා ලද යම් කොමිස් මුදල් ;

(ඒ) විදේශීය ව්‍යවහාර මුදලින් භාර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද යම් තැනැත්තකු 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව මැණික් සහ ස්වර්ණාභරණ විකිණීමෙන් විදේශීය ව්‍යවහාර මුදල්වලින් ඒ තැනැත්තා විසින් ලබා ගන්නා ලද මුදලින් ඒ තැනැත්තාට ඇති වන ලාභවල සහ ආදායමේ කොටසක් ;

(ජ) ප්‍රහිත පදනමක් මත, ශ්‍රී ලංකාවට ගෙන්වනු ලැබ, අවස්ථාවෝචිත පරිදි මැණික් ගල්, ලෝහ හෝ භාණ්ඩ යම් සකස් කිරීමකට හෝ නිෂ්පාදනය කිරීමකට භාජනය නොකොට නැවත අපනයනය කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි ඒ මැණික් ගල්, ලෝහ හෝ භාණ්ඩ වන—

(i) ශ්‍රී ලංකාවෙහි කණිනු නොලැබූ යම් මැණික් ගල් හෝ ලෝහ ;

(ii) යම් ඛනිජ තෙල් නිෂ්පාදන ; හෝ

(iii) ඒ භාණ්ඩ අපනයනය කිරීමෙන් රටට උපචිත වීමට ඉඩ ඇති විදේශ විනිමය වාසි කෙරෙහි සැලකිල්ල ඇතිව, මේ ඡේදයේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් එවැනි නිෂ්පාදන,

1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව අපනයනය කිරීමෙන් ප්‍රහිතකරුට හෝ ප්‍රහිත ලාභියාට ශ්‍රී ලංකාවේ දී ඇති වන ලාභ සහ ආදායම් ;

(ට) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රදානයක් වශයෙන් යම් තැනැත්තකු විසින් ලද යම් ත්‍යාග මුදලක් ;

(ඩ) යම් තැනැත්තකු විසින් කරන ලද නව නිපැයුමක් හෝ භාර ගන්නා ලද යම් පර්යේෂණයක් පිළි ගැනීමක් වශයෙන් ආණ්ඩුව විසින් කරන ලද ප්‍රදානයක් ලෙස ඒ තැනැත්තා විසින් ලබාගත් ත්‍යාග මුදලක් ".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (ආ) ඡේදයෙහි "ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයකින් අමාත්‍යවරයා විසින් ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද ප්‍රයෝජනයට ගැනීමකට" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයකින්, 1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර අමාත්‍ය වරයා විසින් ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය පිට අනුමත කරන ලද ප්‍රයෝජනයට ගැනීමකට" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16අ සහ 16ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 16අ සහ 16ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"1979 නොවැම්බර් මස 15 වන දිනට පසුව සංස්ථාගත කරන ලද සංචාරක හෝටල් වලට අදාළ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16අ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක, (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම, ඒ ව්‍යවසාය විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කළ දින සිට ආගණනය කරනු ලබන අවුරුදු දහයක කාලයකට, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ;

(ආ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරන ලද නිලැයිස්තුගත පොදු සමාගමක් විසින් කර ගෙන යනු ලබන්නා වූ; සහ

(ඇ) සහභාග සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රුපියල් කෝටි දහයකට නොඅඩු

සංචාරකයන් සඳහා හෝටල් පවත්වාගෙන යන්නා වූ යම් ව්‍යවසායකට අදාළ විය යුතු ය.

1979 නොවැම්බර් මස 15 වන දිනට පසු අතිරේක නිදන කාමර ඉදිකරනු ලබන්නා වූ සංචාරක හෝටල් වලට සම්බන්ධ ඇතැම් ව්‍යවසායවල ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

16ආ. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 6 (1) (v) වන වගන්තිය යටතේ හෝ මේ පනතේ 16 අ වගන්තිය යටතේ හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ සංචාරකයන් සඳහා හෝටල් පවත්වාගෙන යන්නා වූ ව්‍යවසායක් 1979 නොවැම්බර් මස 15 වන දිනට පසුව එහි ප්‍රයෝජනය සඳහා අතිරේක නිදන කාමර ඉදිකරනු ලබන්නේ ද ඒ ව්‍යවසායේ අදාළ ලාභ සහ ආදායම, ඒ අතිරේක නිදන කාමර ඉදිකිරීම, ලංකා සංචාරක මණ්ඩලයේ නිර්දේශය මත, සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය යයි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්, ඒ අතිරේක නිදන කාමර ඉදිකරනු ලැබූ දින සිට ආගණනය කරනු ලබන අවුරුදු පහක කාලයක් සඳහා, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "අදාළ ලාභ සහ ආදායම" යන්නෙන්, 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන ලාභ සහ ආදායම හැර) ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායමට, 1979 නොවැම්බර් මස 15 වන දිනට පසුව ඉදිකරන ලද අතිරේක නිදන කාමර සංඛ්‍යාව සහ ඒ ව්‍යවසායේ නිදන කාමර මුළු සංඛ්‍යාව අතර අනුපාතයට සමාන අනුපාතයක් දරන මුදලක් අදහස් වේ.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 22අ, 22ආ සහ 22ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ, 22ආ, සහ 22ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"ඇතැම් ගිවිසුම ඉටු කිරීමෙන් ඇති වන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22අ. (අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කළ ; සහ

(ආ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග ඇතුළත් වූ ද ඒ අධිකාරිය විසින් භාර ගන්නා ලද යම් වාරිමාර්ග යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය බවට වූ ඒ අධිකාරියේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ගිවිසුමක් ඉටු කිරීමෙහි හුදෙක්ම නිරත වූ

යම් නිල ලැයිස්තුගත පොදු සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත්වන ලාභ සහ ආදායම නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ සමාගම විසින් ඒ අධිකාරිය සමග ඇතුළත් වූ පළමු ගිවිසුමෙහි දින සිට ආගණනය කරනු ලැබූ අවුරුදු පහක කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

දේපළ සංවර්ධනයෙහි නිරත ව්‍යවසායන්ගේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22ආ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් සමාගමක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත් වන ලාභ සහ ආදායම නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ සමාගම ව්‍යාපාර කටයුතු කරගෙන යෑම ආරම්භ කරන ලද දින සිට ආගණනය කරන ලද අවුරුදු දහයක කාලය සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) 1979 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව සංස්ථාගත කරනු ලැබූ ; සහ

(ආ) ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කරන දිනයෙහි නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ නැතහොත් ව්‍යාපාර

කටයුතු කරගෙන යාම ආරම්භ කරන ලද දින සිට අවුරුදු දෙකක් ඇතුළත නිල ලැයිස්තුගත පොදු සමාගමක් බවට පත් වන්නා වූ ; සහ

(ඇ) ආණ්ඩුවේ නාගරික සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අත්‍යවශ්‍ය යයි (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද) නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද දේපළ සංවර්ධන යෝජනා ක්‍රමවල හුදෙක්ම නිරත වූ

යම් සමාගමකට අදාළ විය යුතු ය.

බලයලත් පොදු සමාගම් මගින් කරගෙන යනු ලබන ව්‍යවසායන්ගේ ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

22ඇ. (අ) නිල ලැයිස්තුගත පොදු සමාගමක් මගින් කරගෙන යනු ලබන,

(ආ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ

යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් අත්වන යම් ලාභ සහ ආදායම නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව ලාභ සහ ආදායම ඒ ව්‍යවසායෙන් කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන්, ප්‍රතිසංස්කරණය කිරීමෙන්, අත්කර ගැනීමෙන් ඇති කරනු නොලැබුවේ නම්, ඒ ව්‍යවසාය විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යාම ආරම්භ කළ දින සිට ආගණනය කරනු ලැබූ අවුරුදු පහක කාලයක් සඳහා ඒ ව්‍යවසාය ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයෙහි—

(i) "1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට, "1981 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "1980 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ඒ ඡේදයෙහි යෙදෙන කවර විටක වුව ද ඒ ඉලක්කම් සහ වචන වෙනුවට "1981 අප්‍රේල් මස 1 වන දිනට පෙර" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි "යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් හැර" යන වචන වෙනුවට "යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලබන මෝටර් බයිසිකලයක් හෝ බයිසිකලයක් සහ ඒ තැනැත්තාගේ සේවා නියුක්තයන් ඔවුන්ගේ වැඩ කරන ස්ථානවලට සහ වැඩ කරන ස්ථානවලින් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන මෝටර් කෝච් රථයක් සම්බන්ධයෙන් හැර," යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු වගන්තිය අවසානයෙහි පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(v) අවුරුදු හයක් නොඉක්මවන කාලයක් සඳහා ඔහු විසින් වාර්ෂිකයක් ගෙවිය යුතු අවස්ථාවක, ඒ වාර්ෂිකය වටිනා සහ ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා හෝ ඒ වාර්ෂිකය ලබන්නාගේ ජීවිතාන්තය දක්වා වූයේ නම් මිස, එවැනි යම් වාර්ෂිකයක් වශයෙන් ඒ අවුරුද්ද තුළ ඔහු විසින් ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය .".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා පුණ්‍යායතනයක බදු අය කළ හැකි ආදායම—

(අ) 31 වන වගන්තිය යටතේ ඒ ආයතනයට හිමිකම් ඇති යම් දීමනාවක් ; සහ

(ආ) රුපියල් දොළොස් දහසක දීමනාවක්

සම්බන්ධයෙන් අඩු කිරීමෙන් පසු ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ආයතනයේ තක්සේරු කළ හැකි ආදායම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ඒ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

'(ඔ) යම් තැනැත්තකු විසින්—

(i) ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනය පනතින් පිහිටුවන ලද ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයට ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පදනමට ;

(iii) 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනතින් පිහිටුවන ලද ටවර් හෝල් රඟහල පදනමට ;

(iv) 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන් දිරිගැන්වීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට

මුදලින් කරන ලද ත්‍යාගයක් ;

(ඕ) යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරන ලද කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් පදිංචි නිවාසයක් වශයෙන් පදිංචිය සඳහා යම් නිවාසයක් හෝ මහල් නිවාසයක් ඉදි කිරීමේ දී—

(i) ඒ නිවාසයේ හෝ මහල් නිවාසයේ බිම් ප්‍රදේශය වර්ග අඩි එක් දහස් පන්සියයක් නො ඉක්මවන්නේ නම් ; සහ

(ii) ඒ නිවාසයේ හෝ මහල් නිවාසය සම්බන්ධයෙන් 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) අනුඡේදයේ හෝ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ දීමනාවක් අඩු කරගත නොහැකි නම්

ඒ තැනැත්තා විසින් වියදම් කරන ලද යම් ප්‍රමාණයක් ;

(ක) 16අ වන වගන්තිය හෝ 22ආ වන වගන්තිය යටතේ අනුමත කරනු ලැබ, ප්‍රාග්ධනය රුපියල් කෝටි පනහක් ඉක්මවන්නා වූ ව්‍යාපෘතියක යෙදී සිටින සමාගමක පවත්නා කොටස් නොවන සාමාන්‍ය කොටස් මිලට ගැනීමේ දී යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද යම් මුදලක්

අදහස් වේ.

මේ ඡේදයේ කාර්ය සඳහා "ප්‍රාග්ධනය" යන්නෙහි, 18 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.';

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "(2) වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන්" යන වචන වෙනුවට "(2) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ක) ඡේදවල සඳහන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "(2) වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන්" යන වචන වෙනුවට "(2) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ක) ඡේදවල සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, එක් එක් තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකුගේ ඒ වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත—

(අ) ඔහු දේපළ භාරගන්නකුගේ, භාරකරුවකුගේ, පොල් මෑකරුවකුගේ හෝ ඇවරකරුවකුගේ තත්ත්වයෙන් ක්‍රියා කරන්නකු නොවන පුද්ගලයකු නම්—

(i) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;

(ii) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 67 වන වගන්තියේ (7) වන උපවගන්තියේ නිර්වාසික පුද්ගලයකු ලෙස සලකනු ලබන්නේ නම්, මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසෙහි සඳහන් අනුප්‍රමාණය අනුව ;

(ඇ) ඒ තැනැත්තා සමාගමක් හෝ (අ) ඡේදය අදාළ වන පුද්ගලයකු හෝ නොවන තැනැත්තකු නම්, 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධ යෙන් මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව." ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ඒ අතිරික්තය සඳහා ඒ තක්සේරු වර්ෂයට" යන වචනවල සිට ඒ උප වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව සේවා යෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාර ලෙස අදාළ වන ක්‍රමයක් අනුව ඉහත සඳහන් මුදල ඒ පුද්ගලයාගේ සේවායෝජක විසින් ගෙවනු ලැබ ඇත්නම්, මේ පනතේ පළමුවන උප ලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව බද්දක් අය කරනු ලැබිය යුතු ය. කොමසාරිස් ජනරාල්වරයාගේ මතය අනුව ඒ සේවායෝජක විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ සියලු පුද්ගලයන්ට ඒකාකාර ලෙස අදාළ නොවන ක්‍රමයක් අනුව ඉහත සඳහන් යම් මුදලක් ඒ පුද්ගලයාට ගෙවනු ලැබ ඇත්නම්—

(i) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ I වන කොටසෙහි ; හෝ

(ii) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසෙහි

සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ඔහුගේ බදු අයකළ හැකි ආදායමෙන් (අතිරික්තය ඇතුළුව) බද්දක් අය කරනු ලැබිය යුතු ය."; සහ

(ඇ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක්" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් ඒ තක්සේරු වර්ෂය වෙනුවෙන් ගෙවීමට යටත් ආදායම් බද්ද—

(අ) (i) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට, ඒ වර්ෂයේ අවසානය දක්වා යම් සමාගමක්, තිල ලැයිස්තුගත පොදු සමාගමක් මෙන්ම කුඩා සමාගමක් ද වී නම්, මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත බදු අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ

අනුව ඒ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණය කින් ; හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේම හෝ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාග මක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ වර්ෂයේ අවසානය දක්වා නිල ලැයිස්තු - ගත පොදු සමාගමක් වූ සමාගමක් සම්බන්ධ යෙන් මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත බදු අනුප්‍රමාණය අනුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ මුදලකින් ; හෝ

(iii) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ වර්ෂයේ අවසානය දක්වා නිල ලැයිස්තුගත පොදු සමාගමක් වූ සහ ජනතා සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට මේ පනතේ දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි සඳහන් උචිත බදු අනුප්‍රමාණය අනුව, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණයකින් ; නැතහොත්

(ආ) (i) (අ) (ආ) අනුඡේදයෙහි හෝ (ඇ) අනුඡේදයෙහි සඳහන් සමාගමක් නොවන වෙනත් සමා ගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයෙහි I වන කොටසෙහි ; හෝ

(ආ) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ සමාගමක් වී නම්, එය සංස්ථා ගත කරනු ලැබූ දින සිට, ඒ වර්ෂයේ අව සානය දක්වා කුඩා සමාගමක් වූ සමාග මක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයේ II වන කොට සෙහි ; හෝ

(ඇ) ඒ තක්සේරු වර්ෂය මුළුල්ලේ ම හෝ ඒ තක්සේරු වර්ෂය තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වී නම්, එය සංස්ථාගත කරනු ලැබූ දින සිට ඒ වර්ෂයේ අවසානය දක්වා ජනතා සමාගමක් වූ සමාගමක් සම්බන්ධයෙන් වන විට, මේ පනතේ දෙවන උපලේඛනයේ III වන කොට සෙහි

සඳහන් උචිත බදු ප්‍රමාණය හෝ ප්‍රමාණ අනුව

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම මත ගණන් බලනු ලැබූ ප්‍රමාණයකින් ; සහ

(ii) යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායම ආගණනය කරනු ලැබුවේ යම් ලාභ මත ද ඒ ලාභවලින් ඒ තක්සේරු වර්ෂය තුළ ඒ සමාගම විසින් බෙදා දෙන ලද මුළු ලාභාංශවල එකතුවෙන් සියයට විස්සකට සමාන මුදලකින්

සමන්විත විය යුතු ය." ; තව ද

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තියේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "(1) වන සහ (1අ) වන උපවගන්තිවල කාර්ය සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි "දෙවන උපලේඛනයේ IV වන කොටසෙහි දැක්වෙන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "දෙවන උපලේඛනයේ V වන කොටසෙහි සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) වාසික සමාගමක් විසින් ඒ නිර්වාසික සමාගමට ගෙවන ලද යම් ලාභාංශ ඇතුළත් නොවන්නා වූ සමාගම විසින් පිටරටට ප්‍රේෂණය කළ හෝ පිටරටෙහි දී රඳවා ගනු ලැබූ මුදල් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈ) පළමු සඳහන් වාසික සමාගම නිල ලැයිස්තුගත පොදු සමාගමක් වන්නා වූ; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි "අදාළ ලාභාංශ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ විට" යන වචන වෙනුවට, "ලාභාංශ 1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ගෙවිය යුතු අවස්ථාවක, සියයට පනහකින් වැඩි කළ විට සහ ලාභාංශය 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ගෙවිය යුතු අවස්ථාවක සියයට විසි පහකින් වැඩි කළ විට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "සමාන ආදායම් බද්දක් ; සහ" යන වචන වෙනුවට "සමාන ආදායම් බද්දක් ;" යන වචන ආදේශ කිරීමෙන් සහ ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි "ආදායම් බද්දක්" යන වචන වෙනුවට, "ආදායම් බද්දක් ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈ) නිල ලැයිස්තුගත පොදු සමාගමකින් යම් නේවාසික සමාගමකට ලැබුණු ලාභාංශයක මුදලින් අදාළ ලාභාංශය ගෙවනු ලබන්නේ නම්, ඒ අදාළ ලාභාංශයේ මුදලින් සියයට පහකට සමාන ආදායම් බද්දක් ".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) "සෑම වාසික සමාගමකට ම" යන වචන වෙනුවට "නිල ලැයිස්තුගත පොදු සමාගමක් නොවන සෑම වාසික සමාගමකට ම"; සහ

(ආ) "යම් කොටස්කරුවකුට ගෙවිය යුතු යම් ලාභාංශ ප්‍රමාණයකින් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් අඩුකර ගැනීමට හිමිකම තිබිය යුතු ය" යන වචන වෙනුවට "යම් කොටස් කරුවකුට 1980 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට තිස්තුනයි තුනෙන් එකකට සමාන ආදායම් බද්දක් සහ 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ලාභාංශ ගෙවිය යුතු අවස්ථාවක, ඒ ප්‍රමාණයෙන් සියයට විස්සකට සමාන ආදායම් බද්දක් අඩු කර ගැනීමට හිමිකම තිබිය යුතුය"

යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද යන වග" යන වචන වෙනුවට "මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ ද නැතහොත් නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ලැබී තිබේ ද යන වග" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) "ඒ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට පනහට සමාන මුදලක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතුය" යන සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ප්‍රමාණය සියයට පනහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට පනහට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය ; තව ද

(ආ) 1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ ප්‍රමාණය සියයට විසිපහකින් වැඩි කළ යුතු අතර, එකී සියයට විසිපහට සමාන ප්‍රමාණයක් ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමේ හිමිකම ඔහුට ලැබිය යුතු ය:";

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම "ඒ සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "ඒ සම්බන්ධයෙන් ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) නිල ලැයිස්තුගත පොදු සමාගමකින් ලැබුණු යම් ලාභාංශයක මුදල සම්බන්ධයෙන්.";

තව ද

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "සියයට තිස්තුනයි තුනෙන් එකක" යන වචන අත්හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත් දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'(1) යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් නිශ්චල දේපළක වටිනාකම ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි එහි වෙළෙඳ වටිනාකම විය යුතු ය:

එසේ වුව ද ධනය තක්සේරු කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද (මේ වගන්තියේ "තක්සේරු කරනු ලබන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ තැනැත්තාගේ ධනයෙන් කොටසක් වශයෙන් 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළ පැවතියේ නම් හෝ 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි අයිතිකරු වූ හෝ ඊට සම්බන්ධතාවක් දරනු ලැබූ වෙනත් තැනැත්තකුගෙන් තක්සේරු කරනු ලබන්නා විසින් ත්‍යාගයක හෝ උරුමයක ආකාරයෙන් අත්කර ගනු ලැබුවේ නම්, 1979 අප්‍රේල් මස 1 වන දිනයෙහි ඒ දේපළෙහි වෙළෙඳ අගය 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් හෝ වෙනස් කිරීම්වල වියදමට සමාන මුදලකින් ද වැඩි කරනු ලැබූ මුදල හෝ ඒ වර්ෂයේ අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ අගය හෝ යන දෙකින් කවර වූ අඩු මුදල 1977 අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "වටිනාකමින් රුපියල් ලක්ෂ තුනක උපරිමයකට යටත්ව, 31 (9) වන වගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ හෝ අර්ථානුකූලව අනුමත පූජ්‍ය කාර්යයක් වන පුණ්‍ය කාර්යයකට ඒ එක් එක් ත්‍යාගයේ වටිනාකම් රුපියල් එක් දහසකට අධිකව දෙනු ලැබූ ත්‍යාගයකට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "වටිනාකමින් රුපියල් ලක්ෂ පහක

උපරිමයකට යටත්ව මේ පනතේ 31 (9) වන වගන්තියේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියේ හෝ අර්ථානුකූලව අනුමත පුණ්‍ය කාර්යයක් වන පුණ්‍ය කාර්යයකට හෝ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි සඳහන් යම් ආයතනයකට, පදනමකට හෝ කොමිසමකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අ) ත්‍යාගය සංයුක්ත වන දේපළ 1977 අප්‍රේල් මස 1 වන දිනට පෙර ත්‍යාගකරු විසින් අත්කර ගන්නා ලද නිශ්චල දේපළක් වන අවස්ථාවක, ත්‍යාගය දෙනු ලැබූ දිනයේ දී ඒ දේපළෙහි වෙළෙඳ අගය 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩිදියුණු කිරීම්, එකතු කිරීම්, හෝ වෙනස් කිරීම්වල වියදමට සමාන මුදලකින් වැඩි කරනු ලැබූ මුදල හෝ ඒ වර්ෂයේ අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ අගය හෝ යන දෙකින් කවර වූ අඩු මුදල 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළෙහි වෙළෙඳ අගය ලෙස සලකනු ලැබිය යුතු ය.".

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය අවසානයේ දී පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(7) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද ශ්‍රී ලංකාවෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින්නා වූ ද පුද්ගලයකු, ඉහතින් වූ උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුවද, ඔහු ශ්‍රී ලංකාවෙහි සේවා නියුක්තිය ආරම්භ කළ දින සිට ගණින් බලනු ලැබූ අවුරුදු තුනක කාලයක් සඳහා නිර්වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ආ) ඡේදයෙහි ඇති "ශ්‍රී ලංකාවෙහි ඇති නොවන ආදායමෙන් ගෙවනු ලැබූ පොලියකට හෝ බැංකුකරුවකු විසින් දෙනු ලැබූ යම් ණයක හෝ අත්තිකාරමක පොලියකට" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවෙහි ඇති නොවන ආදායමෙන් ගෙවනු ලැබූ පොලියකට හෝ බැංකුකරුවකු විසින් දෙනු ලැබූ යම් ණයක හෝ අත්තිකාරමක පොලියකට හෝ යම් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග විදේශ ව්‍යවහාර මුදලින් යම් තැනැත්තකුගේ බැරට ඇති මුදලට ඔහුට ගෙවනු ලැබූ යම් පොලියකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"රක්ෂණයෙන් ලැබෙන ඇතැම් ලැබීම් කෙසේ සලකනු ලැබිය යුතු ද යන වග.

89. රක්ෂණ වැරීන වශයෙන් ගෙවන ලද යම් මුදලක් යම් වෙළෙඳමෙකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් ලාභ හෝ ආදායම් ඉපයීමෙහි ලා දරන්නට සිදු වූ වියදමක් වශයෙන් අඩු

කිරීමට ඉඩ දී ඇති අවස්ථාවක, ඒ රක්ෂණ ගිවිසුම යටතේ ලබාගත් යම් මුදලක් පහත දැක්වෙන පරිදි සලකනු ලැබිය යුතු ය:—

(අ) එසේ ලබාගත් මුදල වෙළෙඳාමේ බඩු තොගය හෝ ලාභ නැති වී යාම හෝ මේ වගන්තියේ (ආ) හෝ (ඇ) වන අනුඡේදයෙහි සඳහන් නොවන වෙනත් යම් මුදලක් සම්බන්ධයෙන් නම්, ඒ වෙළෙඳාමෙන්, ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝ රක්ෂාවෙන් ලැබූ ලැබීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ආ) එසේ ලබාගත් මුදල 23 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අර්ථානුකූලව, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කරනු ලැබූ ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් නම්, දේපළ බැහැර කිරීමෙන් ලබාගත් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තව ද, ඒ අනුව එම වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ඒ මුදල් ප්‍රමාණයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය ;

(ඇ) එසේ ලබාගත් මුදල, 23 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අර්ථානුකූලව, ක්ෂයවීම සඳහා දීමනාවක් ප්‍රදානය කරනු නොලැබූ ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් නම්, දේපළෙහි අයිතිය වෙනස් වීමෙන් ලබාගත් මුදල් ප්‍රමාණයක් වියයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව 7 වන වගන්තියේ විධිවිධාන ඒ මුදල් ප්‍රමාණයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (5) වන උපවගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් සේවා නියුක්තියෙන් ලබන ලාභවලට අදාළ යම් ණය මුදල් ඒ තැනැත්තා විසින් ලබා ගැනීමට ආනුෂංගිකව ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්ද තක්සේරු කිරීම සම්බන්ධයෙන් මේ උපවගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය :

එසේම තවදුරටත් යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු තක්සේරු නොකිරීම හෝ අඩුවෙන් තක්සේරු කිරීම වංචාවක් නිසා හෝ චුවමනාවෙන් ම වැළැකීම නිසා වන අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු කවර වූ හෝ අවස්ථාවක දී ඒ තැනැත්තා පිළිබඳව තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකි ය. ".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (2) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (i) ඡේදයෙහි "සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය." යන වචන වෙනුවට "සියයට පනහක් නොඉක්මවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) ඡේදයෙහි "මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය" යන වචන වෙනුවට "ඒ ත්‍රෛමාසික බදු වාරික ලැබිය යුතු වූ තක්සේරු වර්ෂයේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන නොවැම්බර් මස තිස්වන දින තෙක් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 131අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 131අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" බද්ද මුදලින් ගෙවීම වෙනුවට ආණ්ඩුවට නිශ්චල දේපළ පැවරීම.

131අ. (1) මේ පනතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ යම් බද්දක් ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්, ඒ බද්ද මුදලින් ගෙවීම වෙනුවට ඒ තැනැත්තාට අයත් යම් නිශ්චල දේපළක් ඒ තැනැත්තා සහ කොමසාරිස් ජනරාල්වරයා අතර එකගත්වයෙන් ඒ දේපළ මත තබනු ලබන වටිනාකම අනුව ආණ්ඩුවට පැවරීමට කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. තව ද ඒ දේපළ ආණ්ඩුව වෙත පැවරීමෙන් පසු එය කළමනාකරණය කිරීමේ සත්‍යතාව සැලකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ඉල්ලීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවක, ඉල්ලීම කරනු ලැබුවේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළෙහි වටිනාකම වශයෙන්, ඒ උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව එකඟ වූ මුදල ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු බද්දේ මුදල ඉක්මවන අවස්ථාවක, ඒ අතිරික්තය, 31 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ආ) ඡේදයේ අර්ථානුකූල ව ඉල්ලුම් කරු විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට කරන ලද පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු වගන්තියේ (i) ඡේදයෙහි " සියයට විසිපහකට වඩා වැඩි නොවිය යුතුය; තවද " යන වචන වෙනුවට " සියයට පනහකට වඩා වැඩි නොවිය යුතුය; තව ද " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) " ලංකා සංචාරක මණ්ඩලය " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " ලංකා වෙළෙඳ මණ්ඩලය " යන්නෙන්, වෙළෙඳ මණ්ඩල ආඥාපනතින් සංස්ථාගත කරන ලද ලංකා වෙළෙඳ මණ්ඩලය අදහස් වේ; ';

(ආ) " දරුවා " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " වාණිජ බැංකුව " යන්නෙහි මුදල් නීති පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය; ';

(ඇ) " විධායක නිලධරයා " යන අර්ථකථනයෙහි " රුපියල් එක් දහසකට " යන වචන වෙනුවට " රුපියල් එක් දහස් පන් සියයකට " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) " විදේශීය ව්‍යවහාර මුදල් " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකය " යන්නෙන් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද වාණිජ බැංකුවක ඒකකයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වේ; ';

(ඉ) " දේපළ " යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " නිල ලැයිස්තුගත පොදු සමාගම " යන්නෙන්, ශ්‍රී ලංකාවේ වාසික වූ ද—

(i) කොළඹ තැරැව්කරුවන්ගේ සංගමයේ රීති අනුව ඒ සංගමය විසින් ; හෝ

(ii) කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය විසින් ඉටුකරනු ලබන කර්තව්‍යයන්ට සමාන කර්තව්‍ය වෙනත් යම් මණ්ඩලයක් විසින් ඉටු කරන බව සැලකිල්ලට ගෙන, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන ඒ වෙනත් යම් මණ්ඩලය විසින් හෝ

පළ කරන ලද යම් නිල ලැයිස්තුවක, එහි කොටස් සඳහන් කරනු ලැබූ සමාගමක් බවට තක්සේරුකරු සෑහීමට පත් වන්නා වූ ද සමාගමක් අදහස් වේ.'.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"පළමුවන උපලේඛනය

32 වන වගන්තිය

ආදායම් බද්දෙහි අනුප්‍රමාණය — යම් දේපළ භාරගන්නන්, භාරකරුවන්, පොල්මඃකරුවන් හෝ ඈවරකරුවන් නොවන පුද්ගලයන්.

I වන කොටස

1979 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | | | | බද්දෙහි අනුප්‍රමාණය |
|---|---|---|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන | රු. 4,800 | සම්බන්ධයෙන් | ... | සියයට 7½ |
| ඊළඟ | රු. 4,800 | ,, | ... | සියයට 10 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 15 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 20 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 25 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 30 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 35 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 40 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 45 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 50 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 55 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 60 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 65 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස | | සම්බන්ධයෙන් | ... | සියයට 70 |

II වන කොටස

1980 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බද්දේ අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | | | | බද්දෙහි අනුප්‍රමාණය |
|---|---|---|---|---|
| බදු අය කළ හැකි ආදායමෙහි පළමුවන | රු. 4,800 | සම්බන්ධයෙන් | ... | සියයට 7½ |
| ඊළඟ | රු. 4,800 | ,, | ... | සියයට 10 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 15 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 20 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 25 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 30 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 35 |
| ,, | රු. 4,800 | ,, | ... | සියයට 40 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 45 |
| ,, | රු. 7,200 | ,, | ... | සියයට 50 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඉතිරි කොටස | | සම්බන්ධයෙන් | ... | සියයට 55 |

III වන කොටස

ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ද 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිර්වාසික ලෙස සලකනු ලබන්නා වූ ද පුද්ගලයකුට 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අදාළ විය යුතු ආදායම් බද්දෙහි අනුප්‍රමාණය සියයට 25 කි.

IV වන කොටස

32 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලබන ඇතැම් ලාභවලට අදාළ විය යුතු ආදායම් බද්දෙහි අනුප්‍රමාණ :—

| | |
|---|---|
| පළමුවන රුපියල් 50,000 සම්බන්ධයෙන් | කිසිවක් නැත. |
| ඊළඟ රුපියල් 25,000 සම්බන්ධයෙන් | සියයට 5 |
| ඊළඟ රුපියල් 25,000 සම්බන්ධයෙන් | සියයට 10 |
| ඉතිරි කොටස සම්බන්ධයෙන් | සියයට 15". |

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපලේඛනයේ IV වන කොටස ඒ උපලේඛනයේ V වන කොටස වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) ඒ උපලේඛනයේ III වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"IV වන කොටස

නිල ලැයිස්තුගත පොදු සමාගමක—

නිල ලැයිස්තුගත පොදු සමාගමක බදු අය කළ හැකි ආදායම් මත.. සියයට 40".

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ 4 වන විෂයයේ (ආ) ඡේදයෙහි "සියයට 70" යන වචනය සහ ඉලක්කම් වෙනුවට "සියයට 55" යන වචනය සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.